# කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව
# முகாமைத்துவக் கணக்காய்வுத் திணைக்களம்
# DEPARTMENT OF MANAGEMENT AUDIT

මුදල් අමාත්‍යාංශය
මහලේකම් කාර්යාලය, කොළඹ 01

நிதி, பொருளாதாரம்
செயலகம், கொழும்பு 01

MINISTRY OF FINANCE
The Secretariat, Colombo 01


මගේ අංකය / எனது இல / My No } DMA/HRD/2021/Training

ඔබේ අංකය / உமது இல / Your No }

දිනය / திகதி / Date } 2021.10. 21

ජනාධිපති ලේකම්,
අග්‍රාමාත්‍ය ලේකම්,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්,
විශේෂ වියදම් ඒකක ප්‍රධානීන්.

<u>අවදානම් පාදක වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම පිළියෙළ කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන</u>

ඔබ ආයතනයන්හි ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන් සහ අභ්‍යන්තර විගණකවරුන් වෙත යොමු කරන ලද මගේ අංක DMA/AMC/02/2021/02 හා 2021.04.05, 2021.06.17 සහ 2021.06.30 දිනැති ලිපි කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

02. උක්ත ලිපි මගින් 2022 වර්ෂයේ සිට රාජ්‍ය ආයතනයන්හි වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම අවදානම් පාදක අභ්‍යන්තර විගණන සැලැස්මක් ලෙස පිළියෙළ කරනු ලබන බව දැනුම් දී ඇත. තවද ඉහත ලිපි මගින් අවදානම් පාදක වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම පිළියෙළ කිරීම සඳහා ඔබ ආයතනය සඳහා වූ අවදානම් ලේඛණය පිළියෙළ කර මෙම දෙපාර්තමේන්තුව වෙත එවීමට කටයුතු කරන ලෙසද දැනුම් දී ඇත. ඒ සඳහා අවශ්‍ය උපදෙස් සහ ආකෘති මෙම දෙපාර්තමේන්තුව විසින් ඉහත ලිපි මගින් සම්පාදනය කරන ලදී. උක්ත කරුණ සම්බන්ධයෙන් දැනුවත් කිරීම සඳහා වූ පුහුණු වැඩසටහන් පවත්වනු ලබන බවද එකී ලිපි මගින් දැනුම් දෙන ලදී.

03. ඒ අනුව ඔබ ආයතනයන්හි ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන් සහ අභ්‍යන්තර විගණකවරුන් සඳහා වූ අවදානම් පාදක වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම පිළියෙල කිරීම පිළිබඳව වූ පුහුණු වැඩ සටහනක් **2021.10.26 දින පෙ.ව. 8.30 සිට ප.ව. 3.00 දක්වා Zoom තාක්ෂණය ඔස්සේ** පැවැත්වීමට සැලසුම් කර ඇත.

04. 2022 වර්ෂයේ සිට ඉදිරියට රාජ්‍ය ආයතනයන් සඳහා අවදානම් පාදක වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්මක් පිළියෙළ කළ යුතු වේ. එබැවින් මෙම පුහුණු වැඩසටහන සඳහා ඔබ ආයතනයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක සහ අභ්‍යන්තර විගණක අනිවාර්යයෙන්ම සහභාගී කරවන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි. මෙම පුහුණුවට සහභාගී වන විට ඔබ ආයතනය සඳහා වන අවදානම් ලේඛණය පිළියෙළ කර ඇත්නම් එයද රැගෙන පුහුණුවට සහභාගී වන ලෙස අදාළ නිලධාරීන්ට දැනුම් දෙන්නේ නම් කෘතඥ වෙමි.

05. මේ පිළිබඳව ඔබ විසින් දක්වන සහයෝගය ඉතා අගේ කොට සලකමි.

එස්.ඒ.චන්ද්‍රිකා කුලතිලක
අධ්‍යක්ෂ ජනරාල්


කාර්යාලය / அலுவலகம் / Office } 2484816, 2484500, 2484600, 2484700

අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General } 2484543

ෆැක්ස් / பெக்ஸ் / Fax } 2449496

වෙබ් අඩවිය / வெப் சைட் / website } www.treasury.gov.lk


Desktop/training/2021/5